# මහ කොමසාරිස්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ මා හිතවත් සහෝදර සහෝදරියනි,

නමස්කාර්, ආයුබෝවන්, වණක්කම්!

ඉන්දියාවේ 75 වන ජනරජ දිනය නිමිත්තෙන් ඔබට සුභාශිංසන පිරිනමමි. ඉන්දියානු ව්‍යවස්ථාව බලාත්මක කෙරුණේ 1950 වසරේ අද වැනි දිනකයි. අද වන විට ඉන්දියාව තීරණාත්මක සන්ධිස්ථානයක සිටිනවා. වර්ෂ 2047 වන විට *විකසිත් භාරත්*, එනම් සංවර්ධිත ඉන්දියාවක් බවට පත්වීම සඳහා දැවැන්ත පිම්මකට ඉන්දියාව සූදනම්.

අපගේ අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මහතාගේ මේ සඳහා වන දැක්මේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ රටෙහි ජනතාව එහි කේන්ද්‍රස්ථානයේ සිටීමයි. අප විශ්වාස කරන්නේ *‘සබ්කා ප් රයාස්’* හෙවත් සැමගේ උත්සහය හරහා *‘විකසිත් භාරත්’* යන්න යථාර්ථයක් බවට පත් වනු ඇති බවයි. අපගේ අවබෝධය වන්නේ සංවර්ධනය ප්‍රජාතන්ත්‍රවාදය මෙන්ම ජනතාව විසින් ජනතාව සඳහා වන ජනතාවගේ දෙයක් බවයි.

දේශීය වර්ධනය සහ සංවර්ධනය සඳහා ඉන්දියාවේ දැක්ම අපගේ අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තිය ද මෙහෙයවනු ලබනවා. අපගේ සාගර් (SAGAR) ප්‍රතිපත්තිය අනුව අසල්වැසි රාජ්‍යයන් සැමට වර්ධනය, ආරක්ෂාව, ස්ථාවරත්වය, ප්‍රගතිය සහ සංවර්ධනය ගෙනඒමට අප

ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරිත්වය ශිෂ්ටාචාරමය බැඳීම්, භූගෝලීය සමීපත්වය, සංස්කෘතික සබැඳියාව, එක්සත්බව පිළිබඳ ශක්තිමත් හැඟීම සහ ඉපැරණි හොඳහිත මත ගොඩනැඟී තිබෙනවා.

මෑත වසරවලදී ඉන්දියාව ශ්‍රී ලංකාවේ විශ්වාසනීය සහ රඳාපැවතිය හැකි සහකරුවකු බව යළිත් තහවුරු කර තිබෙනවා. ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරීත්වය සඳහා අපගේ දැක්මේ කේන්ද්‍රස්ථානය හිමිවන්නේ ද ජනතාවට යි. අපගේ හවුල්කාරීත්වයේ මාර්ග සිතියම තීරණය වන්නේ ඔබගේ අවශ්‍යතා සහ අභිලාෂ මතයි. මෙම සාම්ප්‍රදායික සමීපත්වය ආර්ථික සමීපත්වයක් බවට පත් කිරීමට දැන් නව හැරවුමක් ගනිමින් පවතිනවා.

නවතම වෙළඳ සංඛ්‍යා දත්ත අනුව ඇමරිකානු ඩොලර් බිලියන 6කෙ ද්විපාර්ශවික වෙළඳමක් සමඟින් 2022 වසරේදී ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ සහකරු බවට පත් වූයේ ඉන්දියාව යි. මෑත වසරවලදී ශ්‍රී ලංකාවේ විශාලතම විදේශ ආයෝජකයා වූයේ ද අපයි. ශ්‍රී ලංකාවට වැඩිම විදේශ සංචාරකයන් පිරිසක් පැමිණෙන රට ලෙස ඉන්දියාව තවදුරටත් පෙරමුණේ සිටිනවා.

2023 ජූලි මාසයේදී අප දෙරට නායකයන් විසින් එකඟ වන ලද දැක්ම ලේඛනය ක්‍රියාත්මක කරමින් දැනටමත් ලබා ඇති ජයග්‍රහණ තවදුරටත් ගොඩනැගීමට අප කටයුතු කරනවා. ගෝලීය වශයෙන් පිළිගත් ඉන්දියාවේ ආර්ථික විභවතාවය, එහි තාක්ෂණික දියුණුව සහ දිගින් දිගටම පවත්වාගෙන යන ආර්ථික වර්ධනය සමඟින් එක් වූ ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ස්ථායිකරණය, ප්‍රතිසාධනය, යළි ගොඩනැගීම සහ වර්ධනය අප දෙරට ජනතාවගේ සහ සමස්ත

කලාපයේ ම යහපත උදෙසා බලසම්පන්න ආර්ථික හවුල්කාරිත්වයක් ගොඩනඟා ගැනීම සඳහා සුවිශේෂී අවස්ථාවක් ලබා දෙනවා.

මෙම දැක්මේ කේන්ද්‍රීය තේමාවක් වන්නේ ආර්ථික සෞභාග්‍යය වේගවත් කිරීම සඳහා සම්බන්ධකතාවය ඉහළ නැංවීමයි. 2023 වසරේ දෙවන භාගයේ සිට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර බෝට්ටු සේවා යළි ආරම්භ වුණා; ආර්ථික සහ තාක්ෂණ සහයෝගිතා ගිවිසුම (ETCA) පිළිබඳ 13 වන සාකච්ඡා වටය පැවැත්වුණා. බහු නිෂ්පාදන නළය, භූමි සම්බන්ධකතා කොරිඩෝව සහ විදුලිබල ජාල අන්තර් සම්බන්ධතාවය ඉදිරියට ගොස් තිබෙනවා. UPI ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට සියල්ල සූදනම්. අනන්‍ය ඩිජිටල් හැඳුනුම්පත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් පසුගිය දශකය තුළ අප ඉන්දියාවේ අත්දැක ඇති පරිදිම මනුෂ්‍ය කේන්ද්‍රීය පරිවර්තනයන් ශ්‍රී ලංකාවට ද හඳුන්වා දීමට අපේක්ෂා කරනවා.

ශ්‍රී ලංකාව පුරා ආගමික ස්ථාන සූර්ය බලයෙන් බලගැන්වීම, ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ග නවීකරණය සදහා සහයෝගය ලබා දීම සහ බලශක්ති, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධනය සඳහා අයෝජන යන සියල්ල අපගේ අචල මිත්‍රත්වයට සාක්ෂි සපයනවා.

හිතවත් මිත්‍රවරුනි, පසුගිය මාසයේදී මා ඉන්දීය මහ කොමසාරිස්වරයා වශයෙන් වැඩ භාරගත් අතර ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරිත්වය සඳහා පවතින අවස්ථා අසීමිත වන බව මා පිළිගත යුතුයි. මෙමගින් අපගේ ජනතාවගේ ජීවිත මත ඇති කළ හැකි සුවිසල් බලපෑම මා සුබවාදි කරවනවා. එය එම හවුල්කාරීත්වය වඩා ගැඹුරු සහ ශක්තිමත් කිරීමට වඩ වඩා කැප වී කටයුතු කිරීමට මා

පොළඹවනවා. මා මේ සම්බන්ධයෙන් ඔබගේ සහයෝගය අපේක්ෂා කරනවා.

සංවර්ධිත ඉන්දියාවක් සංවර්ධිත ශ්‍රී ලංකාවකට ද හේතු වේවා! අප කැපවන්නේ මේ අරමුණ වෙනුවෙනි.

*ජයි හින්ද්!*

ආයුබෝවන්. වණක්කම්. ස්තුතියි.

- සන්තෝෂ් ජා